# ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ තනතුරු සඳහා තෝරා පත් කිරීමේ ලකුණු පරිපාටිය.

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ තනතුරු සඳහා තෝරා ගැනීමේ පදනම වන්නේ අයදුම්කරුවන් නියමිත ආකෘතිය අනුව යොමු කර ඇති අයදුම්පත්වල ඉදිරිපත් කර ඇති තොරතුරු මත පදනම්ව ජ්‍යෙෂ්ඨත්වය, ක්ෂේත්‍රයේ පළපුරුද්ද, වෘත්තීය සුදුසුකම් සහ සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා කුසලතා සාමාර්ථය ඇගයීමට ලක් කිරීමයි.

<table>
<tr><th></th><th>මාතෘකාව</th><th>උපරිම ලකුණු ප්‍රමාණය</th><th>ඇගයීම් ක්‍රමවේදය</th></tr>
<tr><td>01</td><td>ජ්‍යෙෂ්ඨත්වය<br><br>මෙහිදි උපරිම ලකුණු ලබා දෙනු ලබන්නේ ඉහළම ජ්‍යෙෂ්ඨත්වයක් සහිත අයදුම්කරුවාට වන අතර, අනෙකුත් අයදුම්කරුවන් සඳහා ජ්‍යෙෂ්ඨත්වය සඳහා සමානුපාතිකව ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>සටහන : ශ්‍රී.ලං.අ.ප.සේ II ශ්‍රේණියේ වසර දෙක (02) ක සේවා කාලයක් සහිතව II හා III ශ්‍රේණිවල වසර 12කට වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරාලීමෙන් පසුව I ශ්‍රේණියට උසස්වීම් ලබා ඇති නිලධාරීන්ගේ, එම මුළු සේවා කාලය වසර 12ට සහ II ශ්‍රේණියේ වසර 02ට වඩා වූ අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලයද 1 ශ්‍රේණියේ සේවා කාලයක් සේ සලකා ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>ලකුණු ගණනය කිරීමේදී අවම ලෙස මාස 03 ක කාලයක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.</td><td>ලකුණු 50</td><td>වෘත්තිය පළපුරුද්ද පිළිබඳ ලුහුඩු විස්තරය (CV) / සම්මුඛ පරීක්ෂණය</td></tr>
<tr><td>02</td><td>ක්ෂේත්‍රයේ /ක්ෂේත්‍රවල පළපුරුද්ද<br><br>2.1.අධ්‍යාපන පරිපාලනය<br><br>2.1.අ. විදුහල්පති (ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරියෙකු විදුහල්පති තනතුරක් දැරිය යුතු පාසලක) සේවා කාලයට අදාළව පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>
<table>
<tr><th>සේවා කාලය</th><th>ලකුණු</th></tr>
<tr><td>අවුරුදු 3 ≤ 5</td><td>02</td></tr>
<tr><td>අවුරුදු 5 < 6</td><td>04</td></tr>
<tr><td>අවුරුදු 6 ≤</td><td>05</td></tr>
</table>
<br>2.1.ආ. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ තනතුරක රාජකාරි කිරීම වෙනුවෙන් එම සේවා කාලයට අදාළව පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>
<table>
<tr><th>සේවා කාලය</th><th>ලකුණු</th></tr>
<tr><td>අවුරුදු 3 ≤ 5</td><td>02</td></tr>
<tr><td>අවුරුදු 5 < 6</td><td>04</td></tr>
<tr><td>අවුරුදු 6 ≤</td><td>05</td></tr>
</table>
<br>සටහන : අයදුම්කරුවන් විසින්, රාජකාරි පවරන ලද ලිපිවල පිටපත් සමඟ අදාළ රාජකාරි ඉටුකර ඇති කාල සීමාවන් අදාළ අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් තහවුරු කල යුතුය.<br><br>එම ලේඛන පදනම් කරගෙන ලකුණු ලබා දීමට තීරණය කර ඇති බැවින්, එවැනි සියලුම ලිපි, අධ්‍යාපන සුදුසුකම් සහ වෘත්තිය පළපුරුද්ද පිළිබඳ ලිපිලේඛන ආදර්ශ අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය.</td><td>ලකුණු 15</td><td>වෘත්තිය පළපුරුද්ද පිළිබඳ ලුහුඩු විස්තරය (CV) / සම්මුඛ පරීක්ෂණය</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| | **2.2.** අධ්‍යාපන සංවර්ධනය<br><br>ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඵලදායීතාව, කාර්යක්ෂමතාව, සේවා ලබාදීමේ කාර්යක්ෂමතාව වැනි අධ්‍යාපන සංවර්ධනය වෙනුවෙන් නිලධාරියා විසින් ඍජුව දායකත්වයක් දක්වා ඇති ව්‍යාපෘතීන් සඳහා ලබා ගෙන ඇති සේවා ඇගයීම්/ප්‍රශංසා සහතික/සම්මාන සහතික හා ජයග්‍රහණ .<br><br>***සටහන :** සේවා ඇගයීම් ප්‍රශංසා සහතික 230 බී ප්‍රශංසා හා දෝෂ දර්ශන ආකෘතියට අනුව විධිමත් පරිදි නිකුත් කර තිබිය යුතුය.*<br><br>එක් විෂය ක්ෂේත්‍රයකට අදාළව **ලකුණු 01** **බැගින් උපරිම ලකුණු 05යි** | | |
| 03 | **වෘත්තීය සුදුසුකම් / පර්යේෂණ නවෝත්පාදන**<br><br>**3.1 අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම***<br>අ. පර්යේෂණයක් මත පදනම් වන පශ්චාත් උපාධිය - **ලකුණු 07**<br>ආ. පශ්චාත් උපාධිය (පර්යේෂණ රහිත) - **ලකුණු 06**<br>ඇ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා - **ලකුණු 04**<br>ඈ. උපාධි/පශ්චාත් උපාධි සහතිකය - **ලකුණු 02**<br><br>***සටහන :** බඳවා ගැනීමේදී හෝ කාර්යක්ෂමතා කඩඉම් සඳහා හෝ ශ්‍රේණි උසස්වීම් සඳහා හෝ මූලික සුදුසුකමක් ලෙස අදාළ කරගෙන ඇති අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.*<br><br>**3.2 පර්යේෂණ සහ නවෝත්පාදන**<br><br>අ. අදාළ ක්ෂේත්‍රයේ පේටන්ට් බලපත්‍ර / ප්‍රකාශන හිමිකම සහිත නවෝත්පාදන / නව නිපැයුම් - **ලකුණු 10**<br><br>ආ. ජාත්‍යන්තරව පිළිගත් ශාස්ත්‍රීය සඟරාවක ප්‍රකාශයට පත් කරන ලද අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලියවුණු පර්යේෂණ පත්‍රිකාව - **ලකුණු 05**<br><br>ඇ.පිළිගත් ශාස්ත්‍රීය සඟරාවක පළවූ අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලියවුණු පර්යේෂණ පත්‍රිකාව - **ලකුණු 04**<br><br>ඈ.වැඩ කරන ක්ෂේත්‍රයෙහි සාර්ථක වූ නවෝත්පාදන ක්‍රියාත්මක කිරීම / තොරතුරු තාක්ෂණික විසඳුම් සංවර්ධනය කිරීම. **-ලකුණු 04 බැගින්.**<br><br>***(වාර්තාමය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය)***<br><br>**3.3 ක්ෂේත්‍රයට අදාල පුහුණු**<br><br>අ. මාස 03ක් හෝ ඊට වැඩි කාලයක් - **ලකුණු 01**<br>ආ. දින 10ක හෝ ඊට වැඩි කාලයක් - **ලකුණු 0.5**<br>ඇ. දින 03ක හෝ ඊට වැඩි කාලයක් - **ලකුණු 0.2**<br><br>***සටහන :** ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සේවාරම්භක පුහුණු සහතිකය, අධ්‍යාපන කළමනාකරණ හා පරිපාලනය පිළිබඳ ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලා සහතික සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.* | **ලකුණු 15** | වෘත්තිය පළපුරුද්ද පිළිබඳ ලුහුඬු විස්තරය (CV) / සම්මුඛ පරීක්ෂණය |

| | | | |
|---|---|---|---|
| | **3.4 අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය***<br><br>**(අ)** රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ජාතික භාෂා සුදුසුකම් පරීක්ෂණයේදී ලකුණු 80 සිට 100 දක්වා (NLQ පරීක්ෂණය)<br>**- ලකුණු 04**<br><br>**(ආ)** NLQ පරීක්ෂණයේ දී ලකුණු 65 සිට 79 දක්වා / පිළිගත් විශ්ව විද්‍යාලයකින් / රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවෙන් හෝ වෙනත් ඕනෑම රජයේ පුහුණු ආයතනයකින් ලබා ගත් භාෂාව පිළිබද ඩිප්ලෝමාව **- ලකුණු 03**<br><br>**(ඇ)** NLQ පරීක්ෂණයේදී ලකුණු 50 සිට 64 දක්වා / පිළිගත් විශ්ව විද්‍යාලයකින් / රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවෙන් හෝ වෙනත් ඕනෑම රජයේ පුහුණු ආයතනයකින් ලබාගත් භාෂාව පිළිබද සහතික පත්‍රය හෝ අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී අනෙක් රාජ්‍ය භාෂාව සමත්වීම. **- ලකුණු 02**<br><br>*සටහන : 2020.10.16 දිනැති රා.ප.ච.ලේ අංක 18/2020 හි 5.1.2 වගන්තියට අනුව වලංගුභාවය පවත්වාගෙන ඇත්නම්, පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.*<br><br>**3.5) ඉංග්‍රීසි භාෂා ප්‍රවීණත්වය***<br><br>**අ)** රජයේ පිළිගත් විශ්ව විශ්වවිද්‍යාලයකින් හෝ රාජ්‍ය පුහුණු ආයතනයකින් ලබා ගත් ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාවක් / IELTS විභාගයේ සමස්ථ ලකුණු අගය 6.5 හෝ ඊට ඉහළ,TOFEL - IBT 79 හෝ ඊට වැඩි, TOFEL - CBT 213 හෝ ඊට වැඩි TOFEL-PBT 500 හෝ ඊට වැඩි<br>**- ලකුණු 03**<br><br>**ආ)** පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂා සහතික පත්‍රය<br>**- ලකුණු 01**<br><br>***ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.** | | |
| **04** | **ශක්තීන්**<br>වර්තමාන අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවත්නා ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීමට ඔබ විසින් කරනු ලබන නව යෝජනා ඇසුරින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය යොමු කරන ප්‍රශ්න වලට පිළිතුරු ලබා දීම.<br>i. නිර්මාණශීලීත්වය<br>ii. ක්‍රියාවලි / ක්‍රමවේද සංවර්ධන හැකියාව<br>iii. සන්නිවේදන කුසලතාවය | **ලකුණු 10** | සම්මුඛ පරීක්ෂණය |

| | | | |
|---|---|---|---|
| 05 | **චර්යාත්මක නිපුණතා**<br>අහඹු ලෙස සිද්ධියක් තෝරා ගෙන අධ්‍යයනය කිරීමට අවස්ථාව ලබා දී අයදුම්කරු විසින් එය හසුරුවන ආකාරය අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අසන ප්‍රශ්නවලට ලබාදෙන පිළිතුරු ඇසුරින් ලකුණු ලබා දීම.<br>i. කළමනාකරණ කුසලතා<br>ii. තීරණ ගැනීමේ හැකියාව<br>iii. අන්තර් පුද්ගල සම්බන්ධතාවය / සහයෝගිතා කුසලතා | **ලකුණු 10** | සම්මුඛ පරීක්ෂණය |

**සටහන 01 : ඉහත ලකුණු දීමේ පටිපාටියේ "පිළිගත් විශ්ව විද්‍යාලයක්" ලෙස දක්වා ඇත්තේ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ලැබ ඇති විශ්ව විද්‍යාලයකි.**

**සටහන 02 : ඉහත ලකුණු දීමේ පටිපාටියේ සඳහන් කර ඇති සියලුම පශ්චාත් උපාධි සුදුසුකම්, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගෙන තිබිය යුතු වන අතර, වෙනත් උපාධි ප්‍රදානය කරනු ලබන ආයතන වලින් ලබාගත් එවැනි සුදුසුකම් එම කොමිෂන් සභාව විසින් පිළිගෙන තිබිය යුතුය.**

**බී.ඒ.සී.පී. බමුණුආරච්චි,**
ලේකම්,
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත් සභාව.